රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක :- 01/2010

මගේ අංකය: EST-7/MISCL/03/3051
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2010.07. 19 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**ඩෙංගු වසංගතය මර්ධනය කිරීම**

ඩෙංගු වසංගතය තුරන් කරලීමේ ජාතික වැඩසටහන යටතේ සියළුම රාජ්‍ය ආයතන පරිශ්‍රයන්තුළ සහ අවට ප්‍රදේශතුළ ඩෙංගු සහ වෙනත් රෝග කාරක මදුරුවන් බෝවිය හැකි ස්ථාන විනාශ කිරීම සඳහා 2010 අගෝස්තු මස 02 සඳුදා සහ අගෝස්තු 09 වන සඳුදා ප.ව. 3.15 සිට ප.ව. 4.15 දක්වා කාලය තුළ සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට ඩෙංගු මර්ධනය සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය තීරණය කර ඇත.

02. ඒ අනුව මදුරුවන් බෝවන තැන් සොයා බලා එවැනි තැන් ඉතා පිරිසිදුව සහ තෙත් රහිතව තබා ගැනීමටත් තම සේවා ස්ථාන හා ඒ අවට පරිසරය ඉතා පිරිසිදු තත්ත්වයෙන් පවත්වාගෙන යෑමේ දැඩි අවශ්‍යතාවය පිළිබඳවත් ආයතනවල කාර්ය මණ්ඩල දැනුවත් කළ යුතුය. ඩෙංගු උවදුර තුරන් කරලීම සඳහා ප්‍රධාන වශයෙන්ම මදුරුවන් බෝවන ස්ථාන විනාශ කළයුතු බැවින් එහිලා රජයේ සේවකයන් තුළ පවත්නා සැලකිල්ල සහ කැපවීම අවධාරණය කරමින් සේවා ස්ථානයට පමණක් සීමා නොවී මෙම වැඩසටහන මගින් පරිශ්‍රයෙන් පිටත ඇති මාර්ග, අතුරු මාර්ග, ක්‍රීඩා පිට්ටනි හා වෙනත් පොදු භූමි භාගයන් ද ආවරණය කිරීම ඉතා වැදගත් වේ.

03. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දැනටමත් ජනමාධ්‍ය මගින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති පරිදි ඒ ඒ රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල, වෘත්තීය සමිති, සුභසාධක සමිති සහ මහජනතාවගේ සහයෝගය ඇතිව මෙම වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. මෙය සාර්ථක කරලීම සඳහා සුදුසු පරිදි ක්‍රියාකාරී කමිටු ද පිහිටුවිය හැකිය.

04. මෙම කාර්ය වෙනුවෙන් වැඩිදුරටත් අවශ්‍ය උපදෙස් සහ සහාය ප්‍රදේශයේ සෞඛ්‍ය බලධාරීන්ගෙන් සහ පළාත් පාලන ආයතනවලින් ද ලබා ගැනීමට කරුණාකර පියවර ගන්න.

05. එසේම සෑම සතියකම සුදුසු වේලාවක් වෙන්කර ගෙන ශ්‍රමදාන මගින් කාර්යාල පරිශ්‍රය තුළ ඩෙංගු සහ වෙනත් රෝග කාරක මදුරුවන් බෝවිය හැකි ස්ථාන නැති කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස ද දන්වා සිටිමි.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යංශය